For private circulation only

# THE WAND

## ORGAN OF THE SRI LANKA MAGIC CIRCLE

www.srilankamagic.org

*The Official Guardian of Magic*

September 2016

**Prizes & surprises @ the get-together!**
**See page 3**





**Star Performer**
*Magic Mystics*
**Amarasiri Wijesinghe**

## In this issue


August Get-together P.2
Member NEWS P.3
History of Magic III P.4
September Birthdays P.6
America's got Talent & Choomantar P.7
Photo Gallery P.8


**GET-TOGETHER**
**Sunday 25th September**
**at 9.30 a.m.**


**EDITOR:**
HDN Gunasekara | Tel: 0812421255 | Mobile: 0716420676
E-Mail: hdngunasekara@gmail.com

No. 33/3/A, Galmaduwa Watta Road,
Kundasale 20168,
Sri Lanka

## August Get-together - 28.08.2016

The monthly get together of the SLMC for the month of August 2016 was held at the “Vishmithapaya” on 28/08/2016 commencing at 10.00 am. The following Members were present:
**Amarasiri Wijesinghe, Ajith Fernando, Asanka Pathirana, Banuka Harshajith, Chandrasena Gamage, Chenul Perera, D.D.C.Heendeniya, Devsiri Fernando, Dinesh Thangavel, Emil Eranga, Iranga Gunawardena, Gayan Wickramage, L.A.Seneviratne, Lalith Wickremasinghe, Hiran Seneviratne, Priyantha Gamage, PushpaKanthi, Ranjith Dharmapala, Rajitha Ratnapala, Rohan Jayasekara, Sambuddika Rathnayake, Shelton Jayasekera, Sanjeewa Hewapathirane, Suranjith De Soysa, Trevor Hannibal, Thusitha Jayasekera, Vihan Malitha and Vihan Peiris.**
The notice of absences were received from, **H.D.N.Gunasekera, Keerthi Weerawardena, Ronald De Alwis and Terry Amerasekera.**

The day started with the arrival of Indian magician Sumit Kharbanda and his spouse Ira. They were welcomed by the President Rohan at the gate with a traditional betel leaves. Thereafter the Sri Lanka flag and the SLMC flag were raised by President Rohan and Kharbanda. Both Sri Lankan and Indian National Anthems were played. After lighting the floating lamp the visiting magician signed the Guest Book at the SLMC.

The President Rohan welcomed the gathering and thanked Kharbanda for visiting the SLMC premises.
Thereafter EVP Devsiri took over the proceedings and said that SLMC is honored by their visit. He mentioned about the public magic show organized by the SL Army Corps of Engineers Services Association in collaboration with SLMC on Sunday 16th October 2016, at National Youth Centre Auditorium Maharagama. He handed over a cheque of Rs. 20,000 to the President Rohan, received from the organizers as the first payment for the show. He further said that SLMC has got the opportunity for free use of the Auditorium at SL Army hospital for the Magician of the year contest. This was arranged by the President Emeritus Ronald De Alwis. Devsiri also mentioned about the demise of Wijaya Nandasiri who was a good neighbor of SLMC. VP (Contest) Suranjith provided the details of the Magician of the Year contest that will be held in October 2016.

Priyantha Gamage started the performance for the day by presenting card tricks. He did several amazing performances of appearing and disappearing of cards. This was followed by Trevin Hannibal. He started with card tricks that included mysterious card selection and changing of cards. He then performed his version of Cups & Balls. Finally Trevin did a mind reading trick with an assistant from the audience. The next performer was Vihan Malith and he did producing of balls and vanishing & producing of cards. Finally Dinesh Thangavel presented few coin tricks.

Addressing the gathering Kharbanda said that he and his wife were so touched by the hospitality extended to them by the SLMC. Commenting on the performances by the members he said all performances were of high standard and specially mentioned about Priyantha. He emphasized on the importance of practice.

It was the time for the Star Performer Sumit Kharbanda. It was a complete magic show with lots of various tricks that consisted, cut and restore paper magic, silk magic and vanishing and producing flower inside a glass box. Then with an assistant from the audience he did a coin producing trick. He did fork bending trick with President Rohan as the assistant. Further he performed a trick on select and predicts pictures. Finally he did a mental trick with Shelton and Thusitha as assistants.




There was a sale of magic items by Kharbanda. The treat for the day was sponsored by C. Heendeniya who celebrated his birthday in August. Theproceedings of another interesting day came to an end around 1.00 pm. Thanks should go to Emil Eranga for coordinating Sumit’s Visit.

***-Chrisantha Silva-***

*(See back cover for more pictures)*

# SLMC MEMBER NEWS

## ♣ This month's Get-together

September Get-together will bring you prizes & surprises in addition to Magic. There will be an entrance draw, and the members will have a chance to win gifts. Arrangements are made to screen a video show on Magic. As usual 'Trick of the Month' , a new trick will be demonstrated and taught then and there. Do not miss this get-together.

## ♣ GRAND MAGIC SHOW, National Youth Service Centre - 16th October 2016

Public Magic show organized by the Sri Lanka Army Corps of Engineers Services Association in collaboration with SLMC will be held on Sunday 16th October 2016, at 3.00 p.m. at the National Youth Centre Auditorium Maharagama.
Four magicians - Priyantha, Roshini, Asanka and Sambudhdhika from SLMC will perform at the show. In addition there will be three front curtain acts by Rohan, Lalith and Vihan.
Tickets are priced at Rs. 1000/, Rs. 500/, and Rs. 250/. SLMC requests the support of the members regarding the tickets for the show and Souvenir advertisements. Contact the President (077 7158864) or VP Lalith (077 3047947)

## ♣ MAGICIAN OF THE YEAR & MASTER MAGICIAN CONTESTS 19th October 2016 at the Army Hospital Auditorium, Narahenpita

The above contests will be held on Wednesday, 19th October 2016 at 6.00 p.m. at the Army Hospital Auditorium, Narahenpita. ( 9th floor).
Entrance free. Come with your family and encourage the contestants.
Contact VP Contest, Suranjith (077 7208660) for details.
We thank the President Emeritus Ronald De Alwis for negotiating with the Army Hospital authorities to have the venue free of charge for this purpose.

## ♣ MAGIC CLASS CONTINUES

Magic Class continues at the "Vishmithapaya", on second Sunday of the Month. Enthusiastic youngsters are always there though the number is small. Thank you Shelton, Suranjith and Asanka for 'the extra mile you walk' on behalf of Magic. (Please contact Asanka -0773388195)






# HISTORY OF MAGIC – III මැජික් කලාවේ ඉතිහාසය -III




18 වන සියවස ලොව විද්‍යාත්මක චින්තනය, පර්යේෂණ සහ නව සොයාගැනීම් පිළිබඳවද ප්‍රබෝධමත් වටපිටාවක් ඇතිවූ කාලයකි. අලුතින් සිතන බුද්ධිමත් පිරිස සෑම අංශයකම මතුවිය. මෙතෙක් නොදුටු දේ දැක ගැනීමේ සහ අලුත් අත්දැකීම් විඳීමට ඇති මිනිස් ආශාව ප්‍රයෝජනයට ගනිමින් විද්‍යාත්මක නව සොයාගැනීම් තම දර්ශන සඳහා එක් කර ගැනීමේ ප්‍රවනතාවයක් ද ප්‍රදර්ශක ශිල්පීන් තුලින් මතුවිය. සූර්යාලෝක අන්වීක්ෂය (Solar Microscope), සිනහා වායුව (Nitrus Oxide -Laughing Gas–), ඊතර් (Ether) වැනි සොයාගැනීම් මෙසේ යොදාගන්න ලදී. විද්‍යුතය (Electricity) සහ විද්‍යුත් චුම්බකත්වය (Electro magnatism) සහ ඒ පිළිබඳව විවිධ අත්හදාබැලීම් කෙරුණු මෙම අවධියේ එම සොයාගැනීම් තම දර්ශන සඳහා යොදා ගැනීමට, උගත්කමක් සහ දැනුමක් තිබූ නව මං සොයාගිය මැජික් ශිල්පීහු උත්සුක වූහ. රසායනික ප්‍රතික්‍රියා (Chemical Reactions) මැජික් දර්ශන සඳහා යොදා ගැනීමද නොමඳව දක්නට ලැබුණි.

පැරණි යුරෝපිය මැජික් ශිල්පීන් පිළිබඳව සොයා යාමේදී හමුවූ සුවිශේෂී චරිතයකි Gustavus Katterfelto. මොහු ජර්මන් ජාතිකයෙකි. විටෙක Dr. Katterfelto හා තවත් විටෙක Colnel. Katterfelto නමින් තමාව හඳුන්වාගත් ඔහු දර්ශනය පිළිබඳව දේශකයෙකු, විද්‍යාඥයෙකු ලෙස පෙනීසිට ඇත. උණුසුම් වායු බැලූමක් පළමුව ගුවනට යැව්වේ තමන් බවත් අයිසෙක් නිව්ටන්ට පසුව බිහිවූ ශ්‍රේෂ්ටතම දර්ශනවාදියා තමන් ලෙසටද පෙනීසිටිමින්ම, යක්ෂයාගේ බැල්ම ඇති කළු පැහැ බළලකු (Demonic Black Cat) තම දර්ශන වලදී ඉදිරිපත් කළ අතර පසුව මොහු බොරු කාරයකු, හොර වෙදෙකු (quack) ලෙසද ප්‍රකට විය.





ඇසට නොපෙනෙන ක්ෂුද්‍රජීවන් පැහැදිලිව දැක ගත හැකි තරමට ආලෝක අන්වීක්ෂය දියුණු වී තිබුණු නමුත් සාමාන්‍ය ජනතාව අතර ප්‍රචලිතව නොතිබූ අවධියකි. 1782 ඉන්ෆ්ලුවෙන්සා (Influenza) වසංගතය සමග ලන්ඩනයට පැමිණි Katterfelto අපිරිසිදු ජල බිඳුවක ඇති පියෙවි ඇසට නොපෙනෙන ක්ෂුද්‍රජීව ප්‍රාණීන් තම ප්‍රේක්ෂකයින් වෙත අන්වීක්ෂයක ආධාරයෙන් පෙන්වමින් ලොකු ප්‍රචාරයක් ලබා ගත්තේය. ඔහු තම දර්ශනයන් සඳහා විද්‍යා දේශනයන්ද, අන්වීක්ෂය මගින් ක්ෂුද්‍රජීවීන් පෙන්වීමද, මැජික් අංගයන්ද යොදා ගත් අතර තම කළු බළල් සගයා සම්බන්ද කර ගනිමින් ගුප්ත බලවේගයක් ද ඇති බව ද පෙන්නුම් කළේය. ඒ අතර 'Dr.Batto's Medicine' නමින් ඉන්ෆ්ලුවෙන්සා රෝගය සඳහා බෙහෙතක්ද ලොකු මුදලකට අලෙවි කළේය. (*අප රටේද ප්‍රධාන නගර වල 'පච ගහ' යට සහ වෙළඳ පොළ අසල විජ්ජා පෙන්වා තෙල් බෙහෙත් විකුණූ හොර වෙදුන් පිළිබඳව ජොෂ්ට සාමාජිකයින්ට මතක ඇතුවාට සැකයක් නැත*). Katterfelto රාජකීයයන් වෙතද දර්ශන ඉදිරිපත් කළ නමුදු ටික දිනකින්ම ජනයාගේ මෙන්ම නිතියේද සැකයට භාජනය වූ අතර එක් නගරයක වැඩි කලක් රැඳීසිටීමට නොහැකි විය.




Ludwig Doebler (1801-1864) එකල යුරෝපය පුරා ප්‍රසද්ධියට පත්, රාජකීයයන්ද පිනවූ ඕස්ට්‍රියානු ජාතික මැජික් ශිල්පියෙකි. ඔහුගේ මූලික අංගයක් වූයේ එක් පිස්තෝල වෙඩිල්ලකින් ඉටිපන්දම් සියගණනක් දැල්වීමයි. අනෙක් ජනප්‍රිය අංගය වූයේ තොප්පියක් තුලින් අසීමිත වූ මල් පොකුරු ප්‍රමාණයක් මැවීමයි.

භෞතික විද්‍යාඥකු ද වූ **Doebler** සුළු වෙනස්කම් සහිත නිසල රූප රැසක් යොදාගෙන **'Phantaskop'** නම් උපකරණයක් මගින් චලන රූපයක් පෙන්නුම් කිරීමේ අංගයක්ද තම දර්ශන වලට ඇතුලත් කරගෙන ඇත. චලන සිනමාවේ අදහස මුලින්ම ඉදිරිපත් කළ අයෙකු ලෙසටද **'A pioneer of the moving pictures'** මොහු ගැන සඳහන් වේ.

ඕස්ට්‍රියානු ජාතික ඉතිහාසයේ සුවිශේෂ චරිතයක් ලෙස සැලකෙන **Ludwig Doebler** නමින් වියෙනා නුවර ප්‍රදේශයක් ද නම් කර ඇති අතර ඔහුගේ **200** වන ජන්ම සංවත්සරය නිමෙත්තෙන් **2001** දී මුද්දරයක් ද නිකුත් කරන ලදී.




**Doebler** ගේ ඥාති සොහොයුරෙකු වූ **Johann Nepomuk Hofzinser (1806-1875)** පසුව ප්‍රසිද්ධියට පැමිණි ඕස්ට්‍රියානු ජාතික මැජික් ශිල්පියෙකි.

මොහු විශාල වේදිකා උපකරණ භාවිතයෙන් බැහැරව **card tricks , sleight of hand,** සහ කුඩා උපකරණ භාවිතයෙන් වේදිකාව ජයගත් ශිල්පියෙකු ලෙස ප්‍රකටය.**'Dr. Hofzinser'** යන වේදිකා නම යොදාගෙන ඇත. කාර්ඩ්ස් කුට්ටම වේදිකා අංගයක් ලෙස යොදාගත් මොහු **'Father of cards magic'** ලෙසද හැඳින්වේ.





අමුතුම ආකාරයේ ඇඳුමකින් සහ උස තොප්පියකින් සැරසී **Phillippe** නමින් දර්ශන පවත්මින් ප්‍රසිද්ධියට පැමිණි අයෙකි ප්‍රංශ ජාතික **Jacques Andre Noel Talon (1802 - 1878).**

ඉටිපන්දම් සියගණනක් එකවර දැල්වීම මොහුගේද ආරම්භක අංගය ලෙස විය. යුරෝපයේදී මුල්වරට **Fish Bowl Production** සහ **Linking Rings** ඉදිරිපත් කර ඇත්තේද **Phillippe** ය. ඒ කාලයේදී ලන්ඩනයට පැමිණි චීන මැජික් ශිල්පීන් කණ්ඩායමක් වෙතින් එම රහස් ලබාගත් බවටද සඳහන්ය. (යුරෝපීය මැජික් ශිල්පීන්ගේ නම් ඉතිහාසයට එක් වුවද, ඔවුන් දැනුම ලබා ගත් පෙරදිග ශිල්පීන් පිළිබඳව තොරතුරු නොමැති වීම කණගාටුවට කරුණකි)

**Robert Houdin** තම සටහන් වල **Phillippe** පිළිබඳව විශේෂයෙන් දක්වා ඇත.

**19** වන සියවස මැද කාලයේදී බටහිර මැජික් කලාව නව මාවතකට යොමු වූ අතර එය ඉහළ තලයකට ඔසවා තැබීමට ද එවකට සිටි මැජික් ශිල්පීහු සමත් වූහ. තැන තැන යමින් දර්ශන පැවැත්වූ ශිල්පීන් වෙනුවට මැජික් දර්ශන සොයා යන ප්‍රේක්ෂක ජනතාවක් ඇති කොට, මැජික් ජනතාව වෙත වින්දනය සහ දැනුම ලබා දෙන සෞන්දර්ය අංගයක් බවට පත් කළහ. ප්‍රධාන රඟහල, නෘත්‍ය ශාලා සහ සංගීත ශාලා තුල දිගු කාලීනව දර්ශන ඉදිරිපත් කළ ඔවුහු තමාගේම මැජික් රඟහලක දිනපතා දර්ශන ඉදිරිපත කරන තත්වයට පැමිණියහ.




ප්‍රංශ ජාතික **Jean Eugene Robert 1805-1871 (Robert Houdin)** 'නවීන මැජික් කලාවේ පියා' **(Father of the Modern Magic)** ලෙස විරුදාවලිය ලද මැජික් ශිල්පියාය.

ඔරලෝසු කාර්මික පවුලක උපත ලැබ නීති අධ්‍යාපනය ලැබූ නමුත් **Robert** පසුව පියාගේ ව්‍යාපාරයටම එකතු විය. ප්‍රකට ඔරලෝසු කාර්මික පවුලක ***Josephen Houdin*** සමග විවාහ විය. අහම්බෙන් කියවීමට ලැබුණු මැජික් පිළිබඳ පොතක් නිසා ඔහු මැජික් වෙත යොමු විය. ඔරලෝසු කාර්මික හැකියාව සියුම් මැජික් උපකරණ නිපදවීමට මහඟු පිටුවහලකි. ඔහු වෙනත් ශිල්පීන්ගේ දර්ශන නරඹමින් තම හැකියාවන් දියුණු කර ගත්තේය. **1845** දී පැරිස් නුවර තමාගේම ශාලාවක **(Palis Royal Theatre) 'Soirees Fantastiques'** නමින් දර්ශන ඉදිරිපත් කළේය.

විදුලිබලය යොදගෙන් මැජික් අංග ඉදිරිපත්කල පළමුවැන්නා ඔහුය. අද **Thommy Ten & Amelie** දක්වන ආකාරයේ **second sight (clairvoyant)** ක්‍රමය මුලින්ම ඉදිරිපත් කළ අයගෙන් කෙනකි. **'Suspension by Ether'** නමින් **'Levitation act'** ඉදිරිපත් කළේය. **Houdin** තම සහායකයා ලෙස යොදා ගත්තේ තම පුත්‍රයාය. පෙරදිග **'Mango Tree Trick'** සමානව


**'Marvolous Orange Tree Trick'** ඉදිරිපත් කළේය. යුරෝපය පුරා දර්ශන පවත්වමින් සාර්ථක වූ **Houdin, 1855** දී විශ්‍රාම ගෙන පිටිසර පළාතක ගොවිපලක් ආරම්භ කළේය.

නමුත් **Napolean** අධිරාජයාගේ නියෝගය මත රාජ්‍ය සේවය පිණිස ඔහුට යලිත් මැජික් වෙත යොමු වීමට සිදුවිය. **1856** දී ප්‍රංශ යටත් විජිතයක් වූ ඇල්ජීරියාවේ ගෝත්‍රික-ආගමික නායකයින් ගුප්ත විද්‍යා ක්‍රම වේදයන් මගින් ජනතාව පොළඹවා කැරලි ගසා ප්‍රංශ පාලකයින් පලවා හැරීමට උත්සාහ කර ඇත. **Houdin** වෙත පැවරුන රාජකාරිය නම් මැජික් බලය යොදා ගෝත්‍රික මායා බලයට වඩා ප්‍රංශ මායා බලය ප්‍රභල බව පෙන්වීමයි. තම මැජික් බලය මගින් ඇල්ජීරියානු ගෝත්‍රිකයින් පුදුමයට පත්කළ **Houdin** ඔවුන්ගේ බලය බිඳීම සඳහා තමාට වෙඩි නොවදින බව පෙන්වීමට **'Bullet Catching Trick'** සහ ඔවුන්ගේ සිරුරු අඩපන කිරීමට තමාට හැකිබව පෙන්වීම සඳහා **'Light & Heavy Chest Trick'** ඉදිරිපත් කර ඇත. (මෙහිදී යොදා ගැනුනේ විද්‍යුත් චුම්බකත්ව බලයයි. මෙහිදී පළමුව ශක්තිමත් ප්‍රේක්ෂකයකුට මේසයක් මත ඇති සැහැල්ලු පෙට්ටියක් ඔසවා බලන ලෙස ඉල්ලා සිටී. අනතුරුව තම මායා බලය මගින් ඔහු තුල ඇති ශක්තිය ඉවතට ගන්නා බව පවසා මායා මන්තරයක් සමග අභිනයක් පා යලිත් ඔහුට එය ඔසවන්නට කියයි. මෙවර ඔහු කෙතරම් වෙහෙසුනද එය එසවීමට නොහැකි වෙයි. රහස වන්නේ පෙට්ටියේ පතුල සහ මේසය මතුපිට යකඩ තහඩු වන අතර දෙවන වර විදුලිය මගින් මේසයට ප්‍රභල චුම්බක බලයක් ලබා දීමයි. තම උපරීම වෙර යොදා එය එසවීමට නොහැකි වූ විට මායාකරු තම සිරුර අඩපන කළ බවට ප්‍රේක්ෂකයා පිළිගනී. අනෙක් අය මායාකරුගේ බලය ගැන බියට පත් වේ. එසේම එම පෙට්ටිය අල්ලා බලන්නට එන අයට විදුලි සැර වැද්දවීම මගින් ද **Houdin** ඇල්ජීරියානුවන් බිය ගැන්විය. ප්‍රංශ රජයේ උපක්‍රමය සාර්ථක වූ බවත් කැරැල්ල අසාර්ථක වූ බවත් සඳහන්ය.
(*අද මානව අයිතිවාසිකම් ගැන කතා කරන බටහිර අධිරාජ්‍යවාදීන් මෙවැනි සට කපට ක්‍රියා මගින් එදා තම යටත් විජිතයන් මර්දනය කළ බවට බොහෝ නිදසුන් ඇත*)

ඔරලෝසු කාර්මික දැනුම සහ විද්‍යුතය පිලිබඳ තම දැනුම යොදවමින් **Houdin** විවිධ උපකරණ පිලිබඳ අත්හදා බැලීම් කළ බවද සඳහන්ය. ස්වයංක්‍රිය රොබෝ උපකරණ **(Automata)**, දුරකථනය, වාහන දුර පිළිබඳව මීටරය ආදිය මේ අතර වේ. පසුව මැජික් පිළිබඳව සහ තම මතකයන් ගැන පොත් ද පල කළ **Robert Houdin** මැජික් ඉතිහාසයේ නොමැකෙන නමක් රඳවා, **1871** ජුනි මස **13** දින ලොවෙන් සමු ගත්තේය. **Houdin** වෙනුවෙන් කෞතුකාගාරයක් ඉදි කර ඇති අතර ප්‍රංශ රජය ඔහු වෙනුවෙන් මුද්දර ද නිකුත් කර ඇත.

**Robert Houdin (1805-1871)** 'නවීන මැජික් කලාවේ පියා' ලෙස සලකනුයේ විනෝදාත්මක ප්‍රසංග කලාවක් ලෙස මැජික් ඉදිරියට ගෙන ඒමට මූලික වූ නිසාය. සාමාන්‍ය යුරෝපිය ඇඳුමින් සැරසී මැජික් ඉදිරිපත් කළ, පළමු වෘත්තීය මැජික් ශිල්පියාද **Houdin** ය. (*Jean Eugene Robert තම වේදිකා සකස් කර ගත්තේ තම බිරිඳගේ නම වන Houdin තම නමට එක් කර ගනිමිනි.*)

**(Robert Houdin, Harry Houdini** සමග පටලවා ගත යුතු නැත. ඔවුන් දෙදෙනෙකි. **Harry Houdini (1874-1926), 20** වන සියවස මුලදී ලොව විශිෂ්ටතම මැජික් ශිල්පියා බවට පත් වූ පුද්ගලයාය. *Houdini තම වේදිකා නමට යොදාගත්තේ ආසන්නම යුගයේ සිටි විශිෂ්ටතම මැජික් ශිල්පියා වන Houdin යන නමට අගින් 'i' අකුරක් එකතු කර ගනිමිනි. Houdini ගැන අපි පසුව කතා කරමු.*)








## September Birthdays

| | |
|---|---|
| 1st | Crishantha Silva |
| 5th | Naminda Warakagoda |
| 9th | Vishara Jayasekara |
| 22nd | B.Anandarajah |

**David Copperfield turned 60 on 16th September!**
**We wish you a Magical future!**



## Tommy Ten and Amelie, Runners-up at the America's got talents





Tommy Ten & Amelie, the world's No.1 Clairvoyant duo, who were in Sri Lanka last February, emerged the Runners-up at the finals of the America's got Talent show. They have presented an amazing act at their finals on September 13th, where Amelie while plunged herself in a water casket, correctly read the numbers of a Credit Card held by a judge.

12 year old talented singer Grace Vanderwaal, who won the hearts of the people emerged the winner at the end. Though the Clairvoyant s couldn't win, we magicians enjoyed their presentation as one of the best Clairvoyant acts, with some resemblance to Houdini's 'Water Torture Cell'.

**Congratulations Tommy & Amelie!**

## Sumangala Silva to Represent SLMC at the CHOOMANTAR Magic Asia 2016




After having conducted Choomantar conventions in Hyderabad bi-annually since 1996 successfully, it was decided to conduct Choomantar Magic Asia 2016 International Magicians Convention where magicians from more than 10 Asian countries would be participating. We will be organizing workshops, gala shows and competitions. The magicians will compete for Medals of Magic Asia (Gold, Silver and Bronze), attractive cash prizes and certificates. I heartily welcome all the magicians to this grand international convention.

The convention will host star magicians from China, Hong Kong, Taiwan, USA, Thailand, Philippines, Indonesia and Sri Lanka. They are prize winners at different international competitions including prism. They will be performing different acts in the two-day(19th&20th Nov) gala shows. Please don't miss Lecture-cum-demo sessions by noteworthy magicians.

Sumangala Silva from Sri Lanka was recommended by the Sri Lanka Magic Circle.



### සිහිකැඳවීමක් !

පසුගිය අගෝස්තු ‘Wand’ සඟරාවේ පලකළ දැනුම්දීමක් පිළිබඳව ඔබේ අවධානය යලිත් යොමුකරවනු කැමැත්තෙමි. වියදම් අඩු කර ගැනීමේ පියවරක් ලෙස, සේවා ගාස්තු ගෙවා නොමැති සාමාජිකයන් වෙත ඔක්තෝබර් මස සිට ‘Wand’ සඟරාව තැපැල් මගින් නොඑවන බවත්, මාසික හමුවේදී පමණක් පිටපතක් ලබාගත හැකි බවටත් විධායක සභා තීරණයක් ගත් බව පසුගිය ‘Wand’ සඟරාවේ ඔබ දුටුවාද? විද්‍යුත් පිටපත පමණක් අවශ්‍ය සාමාජිකයන් ඒ බව දැනුම් දෙන ලෙසටත් එහි සඳහන් විය.

(විද්‍යුත් පිටපත පමණක් සෑහෙන බවට සාමාජික කිහිප දෙනෙකුම දැනුම් දී ඇති බවත් එමගින් සංගමය වෙත මාසිකව යම් මුදලක් ඉතිරි වන බවත් දැනුම් දෙන්නේ සතුටිනි. ඔබ විද්‍යුත් තැපැල භාවිත කරන්නේනම් ඔබේ Email ලිපිනය අප වෙත දැනුම් දෙන්න. )

ඉතින් ඔබ සාමාජික ගාස්තු සහ සේවා ගාස්තු හිඟ සමාජිකයෙකුනම් ලබන මස සිට ‘Wand’ සඟරාව තැපැල් මගින් ඔබට නොලැබෙනු ඇත. ඔබ මෙම වසර සඳහා සේවාගස්තු ගෙවා ඇතිදැයි නිවැරදිව දැනගැනීමට ගරු භාණ්ඩාගාරික අමරසිරි විජේසිංහ (0779879274) අමතන්න.